මගේ අංකය: 3/සීජ්/එම්එෆ්

ජ්‍යෙෂ්ඨ සංඛ්‍යාලේඛණඥ/සංඛ්‍යාලේඛණඥ,

සංඛ්‍යාලේඛන අංශය,

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය

## කෘෂිකර්ම සංගණනය - 2002

අප දෙපාර්තමේන්තුව මගින් පවත්වනු ලබන මීලඟ කෘෂිකර්ම සංගණනය 2002 වසරේදී පැවැත්වීම සඳහා අවශ්‍ය ආකෘති පත්‍ර හා උපදෙස් පත්‍රිකා දැනටමත් පිළියෙල කෙරෙමින් පවතී. මෙම සංගණනයේ ක්ෂේත්‍රයේදී භාවිතා කිරීමට අපේක්ෂිත ප්‍රශ්ණ මාලා පිළිබඳ පූර්ව පරීක්ෂාවක් 2001 වසරේ නොවැම්බර් මස දෙවන සතිය තුලදී පැවැත්වීමට යෝජිත අතර එකී කාර්යය කොට්ඨාශ භාර සංඛ්‍යාලේඛන නිලධාරීන් මගින් ඉටු කිරීමට ද අපේක්ෂිතය.

සෑම ප්‍රා.ලේ. කොට්ඨාශයක්ම නියෝජනය වන පරිදි එක් ග්‍රා.නි. කොට්ඨාශයක් තෝරා ඒවායේ එක් සංගණන කාණ්ඩයක බැගින් මෙම පූර්ව පරීක්ෂාව පැවැත්වීමට අදහස් කරමි. මේ සඳහා නියැදි රාමුව ලෙස භාවිතා කරන්නේ මෙම වසරේ පැවති ජන හා නිවාස සංගණනයේදී පිළියෙල කල F1 ලේඛණයයි. එබැවින් F1 ලේඛණ ප්‍රධාන කාර්යාලයේ සංගණන අංශය වෙත එවීමට ප්‍රථම පහත පියවර අනුගමනය කරමින් සෑම ප්‍රා.ලේ. කොට්ඨාශයකින්ම එක් සංගණන කාණ්ඩයකට අදාල F1 ලේඛණයේ ඡායා පිටපතක් ඔබ භාරයේ තබා ගැනීමට ඉක්මනින් කටයුතු කරන්න.

1. ප්‍රා.ලේ. කොට්ඨාශය තුල ඇති ග්‍රාම නිලධාරී කොට්ඨාශ වලින් එකක් (වතු අංශය හැර) සරල සසම්භාවී ක්‍රමයට තෝරා ගන්න.
2. ඉහත 1 යටතේ තෝරා ගත් ග්‍රා.නි කොට්ඨාශයේ ඇති සංගණන කණ්ඩ වලින් එකක් සරල සසම්භාවී ක්‍රමයට තෝරා ගන්න.
3. ඉහත 2 යටතේ තෝරා ගත් සංගණන කණ්ඩයට අදාල F1 ලේඛණයේ සම්පූර්ණ ඡායා පිටපතක් ලබා ගෙන එය ඔබ වෙත භාර දෙන්නැයි සියලුම කොට්ඨාශ භාර සංඛ්‍යාලේඛණ නිලධාරීන්ට දැනුම් දෙන්න.
4. මෙසේ තෝරාගත් කාණ්ඩ වල ප්‍රා.ලේ./ග්‍රා.නි./ගම පිළිබඳ නාම ලේඛණය මා වෙත දන්වා එවන්න.

කා/දි

නියෝජ්‍ය අධ්‍යක්ෂ,

කෘෂිකර්ම සහ පාරිසරික සංඛ්‍යාන අංශය

2001.09.18

අංක 30,අශෝක උයන,

කොළඹ 04.